# අපවත්වීමෙන් කම්පා වී සිටි නිසා මොනවා කියවුණා දැයි මතක නෑ

## මාධ්‍යයට කළ ප්‍රකාශය ගැන ශාන්ති පී. ජයසේකර කියයි

**මහාචාර්ය ශාන්ති පී. ජයසේකර**
**විසින් සම්පාදිත තොරතුරු ප්‍රකාශය**
**සිංහලට සකස් කළේ**
**කේ.ඩී.එම්. කිත්තන්පහුව**

**ප්‍ර : ඔබ දැනට කොපමණ කාලයක් රුසියාවට වී සිටිනවාද?**

පි : විසි වසරකට වැඩියි.

**ප්‍ර: ඔබ එහි කුමක් කරනවාද? ඔබ සමත් වී ඇති විභාග මොනවාද?**

පි: පී.එච්.ඩී., ඩී.එස්.සී හා අයි.යූ.එෆ්.එස්. ලාභී, අයි.සී.සී.අයි.ඒ ජාත්‍යන්තර අධ්‍යාපන පීඨයේ උප සභාපති, විදේශ සම්බන්ධතා, ක්‍රීඩා කොමිසම හා ධූමා හී ජාත්‍යන්තර ආරක්ෂක කවුන්සිලයේ සභාපති



**ප්‍ර: ඔබ පූජකවරයෙක් ද?**

පි : මා හොඳ බෞද්ධයෙක්. විවාහ වී සිටින්නේ රුසියන් කාන්තාවක් සමඟ. මට දරුවන් දෙදෙනකු සිටිනවා.

**ප්‍ර : 'රෙවරන්' යන 'ගෞරවනීය' නාමයෙන් ඔබව අමතන්නේ ඇයි?**

පි: අමෙරිකානුවන් පූජකයකු අමතන්නේ එයාකාරෙනුයි. මෙය බෞද්ධ,, ක්‍රිස්තියානි සහ ඉස්ලාමීය ආදී ඕනෑම පූජකවරුන් පාවිච්චි කරන්නක්. ඒ වාගේම සාමයික විද්වතුන් සහ පූජකයින් නොවන සමාජමය වැඩසටහන් වල නිරත පුද්ගලයින් ද මෙම නාමයෙන් අමතනු ලබනවා. බුදු දහම, ඉස්ලාම් ලබ්ධිය සහ අන්‍ය සියලු ආගම් හදාරන සිසුන්ට ඔවුන්ගේ එම ආගම් ධර්ම පිළිබඳව මෙම ජාත්‍යන්තර දේව ධර්ම විද්‍යා විශ්ව විද්‍යාලයයෙන් උපාධි ලබාගත හැකියි. සියලුම උපාධිධාරින්ට මෙම 'ගෞරවනීය' නාමය ප්‍රදානය කෙරෙන අතර ඔවුන් එනමින් හඳුන්වනු ලබනවා. 'ගෞරවනීය' යන්නෙන් අදහස් කෙරෙන්නේ 'ගෞරවය ලැබිය යුත්තා' යන්නයි.

**ප්‍ර: ඔබගේ විශ්වවිද්‍යාලය කිතුනු ලබ්ධිය අවධාරණය කරනු ලබන්නේ ද? එසේම පුද්ගලයින් කිතුනු ලබ්ධියට හරවා ගැනීම සඳහා දිරි ගැන්වීමක් කරනවා ද?**

පි : මෙය බහු ජාතික ආයතනයක්. විවිධ ආගම් අදහන සිසුන් සිටිනවා. කිතුනු ලබ්ධියට නම්මා ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙරෙන්නේ නැහැ.

**ප්‍ර: ඔබගේ අයි.යූ.එෆ්.එස්. විශ්වවිද්‍යාලයට රාජ්‍ය නොවන සංවිධානවල සම්බන්ධයක් තිබෙනවද?**
පි : නැහැ.

**ප්‍ර: ඔබ අවසන් වරට ශ්‍රී ලංකාවට පැමිණියේ කවදා ද?**

පි: පසුගිය වසරේ මම නිවාඩුවට ශ්‍රී ලංකාවට පැමිණියා. පූජ්‍ය ;සෝම හිමියන්ගේ විහාරයට යාමට සිදු වුණත්, එහි දී හමු වුයේ පූජ්‍ය වජිර හිමියන් පමණයි. පූජ්‍ය සෝම හිමියන් විසින් රචිත බුද්ධස්තූප ග්‍රන්ථය ඇතුළු පොත් රැසක් එහිදී ලබා ගැනීමට හැකි වුණා. බුද්ධස්තූප පොත සම්බන්ධයෙන් විස්තර සැපයීමෙන් පසුව සෝම හිමියන්ට පී.එච්.ඩී. උපාධිය ලබා දෙන ලෙස පූජ්‍ය වජිර හිමියන් ඉල්ලා සිටියා. මගේ සහෝදරයාත් කියා සිටියා, මෙම වටිනා ග්‍රන්ථය වෙනුවෙන් උපාධියක් පිරිනමන්නේ නම් එය රටට මෙන්ම,

බුද්ධාගමටත් විශාල ගෞරවයක් අත්කර දීමට සමත් වෙනවා කියා. මා ආපසු රුසියාවට ගිය පසු මම මේ පොත කියෙව්වා. එහි අඩංගු තොරතුරු ඉතා වැදගත් බව මට හැඟී ගියා. පසුව මා එය රුසියන් සහ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කර, අපේ විශ්වවිද්‍යාල විද්වතුන්ට ඒ පිළිබඳව දැනුවත් කළා. අවසානයේදී, පී.එච්.ඩී. උපාධිය පිරිනැමීම සඳහා අවසරය ලබාගත්තා. මේ ග්‍රන්ථය පිළිබඳව මා ජාත්‍යන්තර විභාග කවුන්සිලයට කරුණු පැහැදිලි කිරීමෙන් පසුව සෝම හිමියන් වෙත පී.එච්.ඩී. උපාධිය පිරිනැමීම නිර්දේශ කළා. පූජ්‍ය සෝම හිමියන් සමඟ කීප වරක් දුරකථනයෙන් සාකච්ඡා කිරීමෙන් පසුව,

උන්වහන්සේට ස්වකීය වටිනා කෘති වෙනුවෙන් අයි.යූ.එෆ්.එස්. ආයතනයේ සහ රුසියානු අධ්‍යාපන පීඨයේ මහාචාර්ය ධූරයක් සහ විද්වත් තනතුරක් ලබාදීමේ අවස්ථාව ලැබුණා.

ප්‍ර: මේ ගමනේ දී ඔබට සෝම හිමියන් මුණගැසුනාද?

පි: ඔව්.

**ප්‍ර: රුසියාවට ඒමටත්, ඒවාගේම මෙම තනතුරු ප්‍රදානය පිළිගැනීමටත් සෝම හිමියන් උනන්දුවක් දැක්වූයේ නැද්ද?**

පි : ස්වකීය කෘතිය සඳහා ආධාරයක් ලබාගැනීම සම්බන්ධයෙන් සෝම හිමියන් උනන්දුවක් දැක්වූවා. දුරකථනයෙන් කීපවරක් ම කතා කොට මුදල් ආධාරය සහ මහාචාර්ය පදවිය ගැන විමසුවා

**ප්‍ර: මේ කරුණු ඔප්පු කිරීම සඳහා ඔබට සාධක තිබෙනවා ද?**

පි: අපි විදේශ අමාත්‍යාංශය සහ ලෙනින්ග්‍රෑඩ් රජයේ උප ආණ්ඩුකාර ද්වාස් මයා හමුවී ඔහු ලවා විදේශ අමාත්‍යාංශය මගින් ආරාධනය කරවීමට කටයුතු කළා.

**ප්‍ර : මෙබඳු ප්‍රදානයක් කිරීමට ඔබගේ අයි.යූ.එෆ්.එස්. ආයතනයට අධිකාරි බලයක් තිබේද?**

පි: අයි.යූ.එෆ්.එස්. ආයතනය අභ්‍යන්තර වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක්. උපාධි ප්‍රදානය කිරීම පිණිස ජාත්‍යන්තර විභාග අධිකාරියක් එය සතුව තිබෙනවා.

**ප්‍ර: මොන පදනමක් මතද, උන්වහන්සේට මෙම ප්‍රදානය කරන ලද්දේ?**
පි: උන්වහන්සේගේ වටිනා බුද්ධස්තූප ග්‍රන්ථය සහ අනෙකුත් ඉගැන්වීම් ඒ සඳහා පදනම් වුණා.

**ප්‍ර: මෙම ප්‍රදානය සහ ග්‍රන්ථය රුසියාවේ දී නිර්දේශ කරන ලද්දේ කා විසින් ද?**

පි : අභ්‍යන්තර විභාග අධිකාරිය විසිනුයි.

**ප්‍ර : මොස්කව් ගුවන් තොටුපළේදී උන්වහන්සේ පිළිගනු ලැබුවේද?**

පි: උන්වහන්සේ මොස්කව් ගුවන් තොටුපළේ සිටියේ වෙනත් ස්ථානයකට සංක්‍රමණයවීමේ අපේක්ෂාවෙනුයි. එහෙත් සෝම හිමියන්ව මොස්කව් ගුවන් තොටුපළේදී බලා කියාගෙන, අප උන්වහන්සේ අපේක්ෂාවෙන් සිටින සාන්ත පීටර්ස්බර්ග් ගුවන් තොටුපළ බලා යන ගුවන් යානයකට නැංවීම සඳහා ඉගෝර් නමැති අයෙකුට පවරා තිබුණා.

**ප්‍ර : සෝම හිමියන්ව සාන්ත පීටර්ස්බර්ග් (ලෙනින් ග්‍රෑඩ්) ගුවන් තොටුපළේ දී පිළිගැනීම සඳහා ඔබ සමඟ තවත් අය සිටියා ද?**

පි: ක්‍රීඩා අධිකාරියේ සහ ධූමා ජාතික ආරක්ෂක මංඩලයේ සභාපති, ආචාර්ය ලූකයනෝෆ්, ආචාර්ය ඩියුබෝවස්කි සමඟ මාත් ගුවන් තොටුපළේ දී සෝම හිමියන් මුණ ගැසුණා.
ඒ මොහොතේ සෝම හිමියන් කියා සිටියා පපුවේ කැක්කුමක් තිබෙනවාය කියා. ඒ අවස්ථාවේ අපේ කණ්ඩායම හෘදයරෝග පිළිබඳ හදිසි සේවා මධ්‍යස්ථානයට දැනුම් දී සෝම හිමියන්ව රෝහලට ඇතුළු කළා.

**ප්‍ර : සෝම හිමියන්ට ප්‍රථම වරට රෝහලට ඇතුළත් කළේ කවදා ද?**

පි: ඔක්තෝබර් 11 දින සාන්ත පීටර්ස් බර්ග් හි අංක 2 රෝහලටත්, හදවත් රෝග යෝග්‍යතා මධ්‍යස්ථානයටත් ඇතුළත් කළා.

**ප්‍ර : රුසියාවේ දී ශල්‍යකර්ම දෙකක් කළාය, එහෙත් එබඳු ශල්‍ය කර්ම දෙකක් කර නොමැතිය කියා මෙරට වෛද්‍යවරුන් පවසතැයි අයි.ටී.එන්. රූපවාහිනියෙන් කළ ප්‍රකාශය ගැන ඔබට පැවසීමට ඇත්තේ කුමක්ද?**

පි: ප්‍රථමයෙන් ම කියන්න වුවමනායි, පූජ්‍ය සෝම හිමියන්ගේ හදිසි අපවත්වීම ගැන මා කම්පනයකට පත්ව සිටි බවත්, ඒ නිසා මා අතින් මොනවා ප්‍රකාශ වුණා ද කියා මට මතක නැති බවත්. ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන්ට අවශ්‍ය පරිදි පරීක්ෂණ පැවැත්වීමට සම්පූර්ණ ඉඩකඩ සලසාදීම සඳහා රුසියාවේ දී පශ්චාත් මරණ පරීක්ෂණයක් නොපැවැත්විය යුතු යයි එරට වෛද්‍යවරුන් සමඟ අරගලයක් කරමින් සිටිද්දී තමයි හදිසියෙන් දුරකථනයෙන් මට කථා කළේ. ඒ නිසා එම

මොහොතේ වැරදීමකින් මා අතින් යමක් කියවුනා නම් ඒ ගැන ශ්‍රී ලංකාවේ සියලු මාධ්‍යවලින් සමාව අයැද සිටිනවා. අවසානයේ දී මගේ ඉල්ලීම ඉටු කිරීම සම්බන්ධයෙන් උප ආණ්ඩුකාර ද්වාසටත්, ශ්‍රී ලංකාවේ රුසියානු තානාපතිතුමාටත් මැදිහත් වීමට සිදුවුණා.

**ප්‍ර : සාන්ත පීටර්ස්බර්ග්වලට පැමිණි දිනයේ දී ම, සෝම හිමියන්ට ශල්‍යකර්මයක් (ස්ටෙන්ටර්/ ෂන්ටින්/ පිනෙස්කෝතෙරපි) කර තිබුණා?**

පි : (ඔක්තෝබර් 11) මේ ශල්‍ය කර්මවලින් පසුව සෝම හිමියන් ගැන තවදුරටත් පරීක්ෂාවෙන් සිටීම සඳහා හෘදය රෝග යෝග්‍යතා මධ්‍යස්ථානය වෙත ගෙන ගියා.

**ප්‍ර : මෙරටින් යවපු මුදල්වලට මොකද වුණේ?**

පි : ශ්‍රී ලංකාවෙන් මුදල් ලැබුණේ ප්‍රමාද වෙලා. ඒ නිසා ප්‍රථම චිකිත්සාව (තෙරපි) සඳහා ගෙවිය යුතු අමෙරිකානු ඩොලර් 8000 ක මුදල ගෙවීම ප්‍රමාද වුණා. එබැවින් ඊළඟට කරන්න තිබුණ ශල්‍යකර්මයට කල් ඇතිව මුදල් ගෙවන්නය කියා රෝහල් බලධාරීන් අපට කීවා. අපි ඒක ඉටු කළා. දවස් 24 කට පසුව දෙවෙනි ශල්‍යකර්මය සඳහා සෝම හිමියන්ව යළිත් එම රෝහලට ඇතුළත් කළා. ඒත් ඔහුගේ ඉන්සියුලින් තත්ත්වය එතරම් යහපත්ව නොතිබුණ නිසා දෙවෙනි ශල්‍යකර්මය කල් දමන්ට සිදු වුණා. මේ අවස්ථාවේදී තමයි, සෝම හිමියන් අපවත් වුණේ. ඒ නිසා අපි කලින් ගෙවූ මුදල ආපසු ලබාදෙන්නය කියා රෝහලට දැන්වූවා. ශ්‍රී ලංකාවට දේහය පිටත් කිරීමේ මොහොත දක්වාවූ වියදම් අයකර ගෙන ඇමෙරිකානු ඩොලර් 2000 ක් අපට ආපසු ගෙව්වා. විස්තර සහිත ඒ සියලු බිල්පත් මම ආපසු එවන්නම්. ඉතිරි මුදල් ගෙවීම් ආපසු එවීම සඳහා කරුණාකර ජනවිජය ගිණුම් අංකය (ඒ.එස්.ඒ.පී) මා වෙත එවන්න.

**ප්‍ර: සෝම හිමියන්ට පී.එච්.ඩී. උපාධිය පිරිනැමීමේ උත්සවය සඳහා කිසියම් මුදල් ප්‍රදානයක් ලබාදෙන බවට පොරොන්දුවක් වී තිබුණාද? එසේත් නැත්නම් එබඳු මුදලක් ලබා දුන්නා ද?**

පි : සෝම හිමියන්ට මුදල් කිසිවක් ලබා දුන්නේ නැහැ. මෙය සෝම හිමියන්ට නොමිලයේ පිරිනැමුණ ප්‍රදානයක් පමණයි. (අයි.යූ.එෆ්.එස්. සහ අයි.ටී.යූ., යූ.එස්.ඒ. ආයතන උපාධි පිරිනමනුයේ අය කිරීමකින් තොරවයි) ගෞරව පිදීමේ උත්සවය සම්බන්ධ සියලු වියදම් අයි.යූ.එෆ්.එස්. ආයතනය විසින් ගෙවනු ලැබුවා. (රුසියානු ඇකඩමියට හා ජගත් විද්‍යාත්මක සංවිධානයට ආරාධනය කළා) රුසියාවේ, සාන්ත පීටර්ස්බර්ග් හි පිහිටි අයි.යූ.එෆ්.එස්. (මූලික අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයය) ආයතනය ලාභ උපයන සංවිධානයක් නොවන අතර කිසිවකුට හෝ මුදල් ආධාර පිරිනමන්නේ නැහැ.

**ප්‍ර: සෝම හිමියන්ට දැනගැනීමට සැලැස්වූ, රුසියානු රජය, රුසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා සහ එක්සත් ජනපද ආයෝජකයෙකු අතර ගිවිසගත් මුදල් ගනුදෙනුව මොකක්ද? ඒකට සෝම හිමියන්ගේ ඇති සම්බන්ධය මොකක්ද? එහි පිටපතක් ඇත්නම් අප වෙත එවන්න.**

පි : ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කරන ලද, මෙම විශේෂ වෛද්‍ය වැඩසටහන ගැන හුදෙක් සෝම හිමියන්ට දැනගැනීමට සැළැස්වූවා පමණයි. වෛද්‍ය වැඩසටහන පිළිබඳ ලේඛනය සහ තමාගේ ආරාධනය මත සෝම හිමියන් රුසියාවට වැඩම කළ බව දැක්වෙන උප ආණ්ඩුකාර ද්වාස් විසින් නිකුත් කරන ලද තවත් ලේඛනයක් මේ සමඟ එවා ඇත.

**ප්‍ර : අපවත්වීමට මසකට පෙර සෝම හිමි විසින් ලබාගත් දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර තොරතුරු කිසිවක් තිබේද?**

පි : ඒ සඳහා මම ඉක්මනින් ඉල්ලීමක් කරන්නම්.

**ප්‍ර : සෝම හිමියන් රුසියාවේදී පෙනී සිටි ඡායාරූප සම්බන්ධයෙන් ඇතැමුන් සැක පහළ කිරීමට උත්සාහ දරනවා. ඒ ගැන ඔබේ අදහස?**

පි : මට ඒ ගැන බොහොම කනගාටුයි. කොහොම වුණත් මතු වී ඇති සැකය පහ කිරීම සඳහා සම්පූර්ණ වීඩියෝ පටිය ඔබ වෙත එවන්නම්. එතකොට සියලුම රූපවාහිනී නාලිකා මගින් එය ප්‍රදර්ශනය කළ හැකියි.

**ප්‍ර : ඔබේ වෙබ් අඩවි පිළිබඳ තොරතුරු?**

පි : යාහූ සර්ච් එන්ජින්